29/03/2012 - ලංකාදීප

**ශාසන පරිහානිය සහ සංඝ කතිකාව - මිලින්ද මොරගොඩ**

www.milindaprashna.com

බුද්ධ දේශනාව තුළ ඇත්තේ සදාකාලික දර්ශනයකි. එය හෙළි කරන්නේ ප්‍රඥාව කරා යන මාවතයි. බිහිකරන්නේ ප්‍රඥාවන්තයින්ය. අනුකාරකවාදීන් නොවේ. ශාසනය අභියෝගයකට ලක්ව ඇත. පාලනයට අනුශාසනා දෙන මහා බලවේගය වූ මහා සංඝරත්නය ගිහි සමාජයේ ඇවතුම් පැවතුම් වෙත නැඹුරු වෙමින් තිබේ.

සංඝරත්නය මහජන නියෝජිතයන් සේ කටයුතු කරති. නොයෙකුත් වෘත්තීන් හි නියැලෙති. එළවලු, පළතුරු හා ධාන්‍ය මගින් පමණක් යැපෙන සංඝයා වහන්සේලා ද සිටිති. මුදල් පරිහරණය නොකරන භික්ෂූන් වහන්සේලා ද සිටිති. එයට හාත්පසින් ම වෙනස් අන්දමට ලෞකික දේ සංඝ සමාජයේ පරිහරණය වෙමින් ද තිබේ. දුරකථන, යාන වාහන, ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී සහ පරිගණක, මෙයින් සමහරකි. සංඝරත්නයට මෙවැනි දේ අකැප ද? කැපවන්නේ කෙසේ ද? සංඝයා වහන්සේලා ධර්මයට අමතරව වෙදහෙදකම් හා දෛවඥ ඇතුළු ශාස්ත්‍ර ප්‍රගුණ කරගෙන සිටිති. අතීතයේ ඒ හෙයින් එකී ශිල්ප ශාස්ත්‍ර ආරක්ෂා විය. නිස්සරණධ්‍යාශයෙන් ක්‍රියා කළේය. එනමුත් අද ඇතැම් වෙහෙර විහාරස්ථාන ගුරුකම් හා යකැදුරුකම් කරන මධ්‍යස්ථානය. තවත් තැනෙක විහාරස්ථානයේ ඉඩ කඩ වෙන්කරගෙන නොයෙකුත් බාහිර ව්‍යාපාර හා අධ්‍යාපන පන්ති පවත්වන බව දැක ගත හැකිය. නීති වෘත්තියට ඇතුළුවීම හා රියැදුරු බලපත්‍ර ලබා ගැනීම යනාදී ගිහි සමාජයට සීමා වූ අංශ කෙරෙහි ඇතුල්වන්නට භික්ෂූන් වහන්සේලා යෝජනා කරති. සංඝ සමාජයේ විහාරස්ථාන හා දේපොල සම්බන්ධ ආරවුල්ය. උසාවි නඩු තීන්දුවල පිහිට යන අවස්ථාය. මෙය පිරිහීමයි.

අප මුහුණ පා සිටින අර්බුදවලට හේතුව සමාජ විනය හා විශ්වාසය පිරිහීමයි. ආණ්ඩු හා එහි පනවන ලද නීිති රීති බිඳ වැටී ඇත. අවංකත්වය, ගෞරවය, මධ්‍යස්ථභාවය හා යුක්තිය වැනි ජනසමාජය ගරු කරන වටිනාකම් නැවතත් ඇති කරගත යුතුය. බෞද්ධ දර්ශනයට අනුව මග සැකසෙන රටක සංඝ සමාජය පිරිහෙන විට සමස්ථ සමාජ දේහයම විකෘතියට පත්වීම නොවැලැක්විය හැකිය.

බුද්ධ දර්ශනය ප්‍රභාවත් කිරීම වෙනුවෙන් නිසි තීන්දුවලට එළැඹීමේ වගකීමක් ත්‍රෛනිකායික මහ නාහිමිවරු ප්‍රධාන මහා සංඝරත්නයට තිබේ. ශාසන පරිහානිය කට පසු නිවැරදි මගට ගත් බව ඉතිහාසයේ සදහන්ය. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පළමු සංගායනාව පවත්වා ඇත. දෙවනුව බුදු රජාණන්වහන්සේගේ පිරිනිවන් පෑමෙන් සියවසරකට පසුව ද, තෙවැන්න මොග්ගලී පුත්තතිස්ස මහ රහතන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පාටලී පුත්ත නගරයේ දී ද පැවති බව මහාවංශයෙහි සදහන්ය. මේ දක්වා ධර්ම සංගායනා දොළහක් පවත්වා ඇති අතර එයින් සංගායනා තුනක් ශ්‍රී ලංකාවේ දී පවත්වා තිබීම සුවිශේෂය. පොළොන්නරු යුගයේ දී මහා පරාක්‍රමබාහු රජතුමන් විසින් ද දඹදෙණිය යුගයේ දී විජයබාහු රජතුමන් ද කතිකාවක් මගින් සංඝ සමාජයේ ප්‍රතිසංස්කරණ ඇතිකරන ලද බව ඉතිහාසය දක්වයි. බාහිර ආක්‍රමණ ඇතුළු නොයෙක් කාරණා මත ශාසනය පිරිහී ගිය අවස්ථාවේ, ශ්‍රී සරණංකර සංග රාජ හිමිපාණන් ගේ මෙහෙයවීමෙන් නැවත උපසම්පදාව පවා ඇති කරන්නට සිදුවිය. මහා සංඝරත්නය සියම් හෙවත් තායිලන්තයෙන් වඩමවාගෙන පැමිණ තිබේ. මෙවැනි සංශෝධන කරන්නට විශාල ශක්තියක් අවශ්‍යය. එය කළ හැකි වූයේ බලවත් රාජ්‍ය නායකයන්ගේ අනුග්‍රහය ඇතිවය.

භික්ෂුවගේ පැවැත්ම ධර්මානුකූලව වෙනස් ගත හැකි ආකාරය ගැන බුදු රජාණන්වහන්සේ පැහැදිලිව දේශනා කර තිබේ. අර්බුදයක් පැන නැගි අවස්ථාවක එයට මුහුණ දෙන්නේ කෙසේ දැයි එදවසට ගැළපෙන පරිදි දක්වා ඇත. විහාර හා දේපොල පවත්වා ගැනීම, දායක කාරකාදීන් සමග පවත්වන

සම්බන්ධතා හා පාලකයාගේ සිට සාමාන්‍ය පුද්ගලයා දක්වා බලය නොව ගුණය අනුව උස් මිටි තැන් හදුනා ගත හැකි අන්දම පැහැදිලිව දක්වා තිබේ. සාකච්ඡාවෙන් සංවාදයෙන් මෙකී කාරණා විසදාගැනීමට ඉඩ ඇත. එය කළ හැකි වන්නේ ශාසනික සංශෝධනයකින් පමණකි. එවැනි සංශෝධනයක් අවශ්‍ය බව පෙනේ. සංස කතිකාවතකට කාලයයි. එයින් පසු සංස සමාජය පමණක් නොව පිරිසිදු ගුණැති හිමිපාණන් වහන්සේලාගේ ආලෝකයෙන් ජන සමාජය ද දිලෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.